# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/65 - 2019 අගෝස්තු මස 09 වැනි සිකුරාදා - 2019.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, හලාවත ජල සම්පාදන ක්‍රමයේ, ජල නල එලීම හා කපාට කුටීර ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ<br>
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 02 වැනි දින,<br>
අංක 35,<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය,<br>
5/2/3/1464.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 568 මුන්නේස්සරම, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මුන්නේස්සරම ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීධරන් මහතා විසින් මැන සකස් කරන ලද අංක 3921 දරන සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ''මුත්තන්කුඩි ඉරුන්ද වෙක්කු අඩිතෝට්ටම්'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 14.50ක් පමණ වන ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *කැබලි අංක* | : | කැබලි අංක 1, |
| *ඉඩමේ නම* | : | මුත්තන්කුඩි ඉරුන්ද වෙක්කු අඩිතෝට්ටම්, |
| *ප්‍රමාණය* | : | පර්චස් 14.50 |

මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | හලාවත සිට කුරුණෑගල මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; |
| *නැගෙනහිරට* | : | තුවාන් සරීෆ් හිමිකම් කියන බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීධරන් මහතා විසින් සකසන ලද අංක 1370 දරන පිඹුරේ කැබලි අංක 01 ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් පරිශ්‍රය ; |
| *බටහිරට* | : | හලාවත ප්‍රාදේශීය සභාව හිමිකම් කියන ඉඩම. |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය :* 1. රාජපුත්‍රගේ තිළිණි දිනේෂිකා මහත්මිය,
පරණ ජල ටැංකිය පිටුපස (තිඹිල්ල වැව අසල),
දදුරු ඔය,
හලාවත.

08 - 905

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, පොල්ගහවෙල - පොතුහැර - අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, පොතුහැර වැඩ භාර නිලධාරී කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 02 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය,
5/2/3/1479.

*උපලේඛනය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 884, අමුණුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අමුණුගම ගමේ පිහිටි, පිඹුරු අංක 2405හි කැබලි අංක 01න් කොටසක් (කැබලි අක්ෂර "A") ලෙස දක්වෙන මුළු ප්‍රමාණයෙන් පර්චස් 85ක් පමණ වන ''මැල්වත්ත '' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

*ඉඩමේ නම* : මැල්වත්ත,
*ප්‍රමාණය* : පර්චස් 85

මායිම්

*උතුරට* : පිඹුරු අංක 2405හි කැබලි අංක 221 1/2, 221 2/2, 222 ;
*නැගෙනහිරට* : ප්‍රධාන පාරේ සිට නිවාසවලට යන පාර ;
*දකුණට* : පළමු පටුමග හා කාණුවේ රක්ෂිතය ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා මැල්වත්ත ක්‍රීඩාංගනය (කැබලි අංක 213හි ඉතිරි කොටස)

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය :* 1. සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

08 - 906

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.